# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2118/59 - 2019 අප්‍රේල් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/73(xii)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග වන මා විසින්, මේ නියමය මගින් එකී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ප්‍රදේශය අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම අභය භූමිය ''කායන්කර්ණි සමුද්‍රීය අභය භූමිය'' ලෙස මින් ඉදිරියට හඳුන්වනු ලබන සහ සලකනු ලැබිය යුතු බවට, මේ නියමය මගින් තවදුරටත් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ජෝන් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2019 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

***කායන්කර්ණි සමුද්‍රීය අභයභූමිය සමන්විත වන භූමි ප්‍රදේශයේ සීමා***

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලේ පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හා එම භූමි ප්‍රදේශය ආශ්‍රිත සමුද්‍ර කලාපයෙහි පිහිටියා වූ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 සිතියම්වලට අනුකූල වන පරිදි SLD 99 ඛණ්ඩාංක පද්ධතියට අනුව ලබා ගෙන ඇති පහත සඳහන් GPS ඛණ්ඩාංක වලින් මායිම් වූ හෙක්ටයාර 953 ප්‍රමාණයකින් සමන්විත වූ භූමි ප්‍රදේශය :

*උතුරට* : මාන්කර්ණි මුහුදු වෙරළේ පිහිටි ආරම්භක ලක්ෂ්‍යය වන ඛණ්ඩාංක නැ.278940 උ. 312029 සිට නැගෙනහිර දෙසට සෘජු සරල රේඛාවක් ඔස්සේ කි.මී. 2.7 ක් පමණ ගිය විට මුහුදේ හමුවන ඛණ්ඩාංක නැ. 281712 උ. 312134 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ගිණිකොණ දෙසට කි.මී. 4.8 ක් පමණ දුරින් මුහුදේ පිහිටි ඛණ්ඩාංක නැ. 286491 උ. 311129 වන ලක්ෂ්‍යය දක්වා ද වේ ;


1A - PG 4284 — 517 (2019/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

*නැගෙනහිරට* : උතුරු මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සෘජු සරල රේඛාවක් ඔස්සේ දකුණු දෙසට කි.මී. 1.9 ක් ගමන්කිරීමේ දී දකුණු දෙසින් මුහුදේ පිහිටි ඛණ්ඩාංක නැ. 286495 උ. 309193 වන ලක්ෂ්‍යයද දක්වාද එතැන් සිට නිරිත දෙසට කි.මී. 3.5 ක් ගමන් කිරීමේ දී පෙරියවට්ටුවාන් ඇලමෝය හමුවන ඛණ්ඩාංක නැ. 284452 උ. 306614 වන ලක්ෂ්‍යය දක්වා ද වේ ;

*දකුණට* : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඇල මාර්ගය ඔස්සේ මීටර් 466 ක් පමණ වයඹ දෙසට ගමන් කිරීමේ දී හමුවන ඛණ්ඩාංක නැ. 284149 උ. 306877 වන ලක්ෂ්‍යය දක්වා ද වේ ;

*බටහිරට* : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසින් කායන්කර්ණී වෙරළ තීරයේ මීටර් 714 ක් දුරින් පිහිටා ඇති ඛණ්ඩාංක නැ. 284380 උ. 307553 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට වයඹ දෙසට ගමන් කිරීමේ දී තෙන්නඩි බොක්කට සමීපව කි.මී. 1.1 ක් පමණ ගිය විට මාර්ගයේ හමුවන ඛණ්ඩාංක නැ. 283794 උ. 308593 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට එම මාර්ගය ඔස්සේ පිහිටා ඇති ඛණ්ඩාංක නැ. 283629 උ. 308609, නැ. 283114 උ. 308681, නැ. 282940 උ. 308793, නැ. 282358 උ. 309282, නැ. 282062 උ. 309522 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට වයඹ දෙසට මීටර් 759 ක් ගමන් කිරීමේ දී වැලිකුඩා පෙරියමුනෙයි තුඩුව ආසන්නයේ ඇල හමුවන ඛණ්ඩාංක නැ 281716 උ. 310198 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට බස්නාහිර දෙසට එම ඇල ඔස්සේ කි.මී. 1.4 ක් ගමන් කිරීමේ දී පිහිටා ඇති ඛණ්ඩාංක නැ. 281613 උ. 310101, නැ. 281496 උ. 310053, නැ. 281380 උ. 309994, නැ. 280917 උ. 309977 වන ලක්ෂ්‍යය දක්වා ද එම ලක්ෂ්‍යයේ සිට වයඹ දෙසට සෘජු සරළ රේඛාවක් ඔස්සේ කි.මී. 2.8ක් ගිය විට වෙරළේ පිහිටි ඛණ්ඩාංක නැ. 278940 උ. 312029 වන ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

KAYANKERNI MARINE SANCTUARY

